# හෙළදිව ධම්ම ගවෙසි සදහම් ආර්ය සමාජයේ

# ව්‍යවස්ථා මාලාව

## 1 වන කොටස

( නාමය, පරමාර්ථය, බල ප්‍රදේශය, ලිපිනය )

1. නාමය :- ''හෙළදිව ධම්ම ගවෙසි සදහම් ආර්ය සමාජය'' යනු මෙම ආර්ය සමාජයේ නාමයයි.

2. පරමාර්ථය :-
   i. හුදී ජන පහන් සංවේගය සඳහා සද්ධර්ම අවබෝධය පිණිස කටයුතු කිරීම.
   ii. දාන, ශීල, භාවනා.
   iii. ශ්‍රමදාන.
   iv. ජාතික ව්‍යවසනයකදී අවශ්‍ය කටයුතු සඳහා සහය වීම.
   v. ජාතික ආගමික සංස්කෘතික හා සමාජීය කටයුතු වලදී ඒකරාශිවීම හා අනෝන්‍යාධාර ලබාදීම.

3. බලප්‍රදේශය :-
   i. සමස්ථ දිවයිනම

4. ලිපිනය :- හෙළදිව ධම්ම ගවෙසි සදහම් ආර්ය සමාජයේ ගරු ලේකම්වරයාගේ ලිපිනය.

## 2 වන කොටස

( සාමාජිකත්වය, සාමාජික මුදල්, සාමාජිකත්වය අහෝසි වීම. )

5. සාමාජිකත්වය :-
   i. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචිකරුවන්, ආර්ය සමාජයේ සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝය.
   ii. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව, වයස අවුරුදු 18ට වැඩි අය විය යුතුය.
   iii. ආර්ය සමාජයට සාමාජිකත්වය සඳහා අළුතෙන් ඉදිරිපත් වන අයෙකු ගරු ලේකම් මහතාගෙන් අදාල අයදුම්පතක් ලබාගෙන, නිවැරදිව සම්පූර්ණ කර ඔහු වෙත භාරදිය යුතු අතර එය කාරක සභාවට ඉදිරිපත් කොට, එහි නිර්දේශයෙන් අනතුරුව අවසාන තීරණය සඳහා මහ සභාවට ඉදිරිපත් කළ යුතුය.

6. ආධාර මුදල් (සාමාජික මුදල්) :-

   නියමිත සාමාජික මුදලක් අය කරණු නොලැබේ. එහෙත් ආර්ය සමාජයේ ඉදිරිපැවැත්ම සඳහා ආර්ය සමාජයේ ව්‍යවස්ථාවේ 1 වන කොටසේ අංක 2. පරමාර්ථය යන ඡේදයේ දැක්වෙන පරමාර්ථයන් ඉෂ්ට සිද්ධ කිරීම, ප්‍රකාශනයන්, ලිපිද්‍රව්‍ය හා සඳහා වූ ආධාර මුදලක් පරිත්‍යාගයක් තම කැමැත්තෙන් ආර්ය සමාජයේ ගරු භාණ්ඩාගාරික තුමාට භාරදී කුවිතාන්සියක් ලබා ගත හැකිය.

7. සාමාජිකත්වය අහෝසි වීම :-

ඉල්ලා අස්වීම, ලිඛිතව කැඳවන සභාවාර 6 කට සහභාගි නොවීම, මරණය හා ආර්ය සමාජයේ පරමාර්ථ වලට එරෙහිව කටයුතු කිරීම.

# 3 වන කොටස

(අරමුදල)

8. අරමුදල :-

i. පරිත්‍යාග මුදල්.

ii. මහ සභාවේ අනුමැතිය ඇතිව, වෙනත් සාධාරණ මාර්ග වලින්ද, ආර්ය සමාජයේ අරමුදල සමන්විත වේ.

# 4 වන කොටස

(අනුශාසක මණ්ඩලය, නිළධාරී මණ්ඩලය, මහ සභාව, කාරක සභාව, සංවත්සර මහා සභාව, විශේෂ මහ සභාව, යෝජනා.)

9. ගරු අනුශාසක මණ්ඩලය :-

මහා සභා රැස්වීමේදී තෝරා පත්කර ගත් ගරු අනුශාසකවරු දෙදෙනෙකුගෙන් අනුශාසක මණ්ඩලය සමන්විත වේ.

10. නිළධාරී මණ්ඩලය :-

ආර්ය සමාජයේ ක්‍රියාකාරීත්වය සඳහා සාමාජිකත්වය අතරින් පහත සඳහන් නිළධාරීන් තෝරා පත්කර ගතයුතුය.

(අ) සභාපති (ආ) උප සභාපතිවරු දෙදෙනෙකු (ඇ) ලේකම්

(ඈ) උප ලේකම් (ඉ) භාණ්ඩාගාරික (ඊ) කාරක සභිකයන් 12ක්

(උ) ගිණුම් පරීක්ෂක (ඌ) ගරු අනුශාසකවරු දෙදෙනෙක්

11. මහ සභාව :-

i. ආර්ය සමාජයේ පූර්ණ බලතල මහ සභාව සතුය.

ii. අවම වශයෙන් තුන් මසකට වරක්වත් ආර්ය සමාජය රැස්විය යුතුය. විශේෂ අවස්ථාවකදී ඊට පෙරද රැස්විය හැකිය. ගරු ලේකම් තුමාගේ ලිඛිත දැනුම් දීමකින්.

iii. කාරක සභාව - අවශ්‍යතාව අනුව ගරු ලේකම් මහතා විසින් කාරක සභාව රැස්කළ යුතුයි. ඝන පූර්ණය මුළු කාරක සභිකයින්ගෙන් දෙකෙන් එකකි.

12. සංවත්සර මහ සභාව :-

i. ගිණුම් වර්ෂය - ආර්ය සමාජයේ ගිණුම් වර්ෂය සෑම වර්ෂයකම මැයි මස 20 වෙනි දින දක්වා වෙයි.

ii. ගිණුම් වර්ෂය අවසන් වී මාස 3ක් ඇතුළත සංවත්සර මහ සභාව පැවැත්විය යුතුය. එහි වැඩසටහනට පහත සඳහන් කරුණු විශේෂයෙන් ඇතුළත් විය යුතුය.

(අ) පසුගිය වර්ෂයේ ප්‍රගති වාර්තාව ලේකම් මහතා විසින් ඉදිරිපත් කිරීම.

(ආ) ගරු භාණ්ඩාගාරික මහතා විසින් වාර්ෂික අය වැය ඉදිරිපත් කිරීම.

(ඇ) ගිණුම් පරීක්ෂක වාර්තාව ඉදිරිපත් කිරීම.

(ඈ) ඉදිරි වර්ෂය සඳහා නිළධාරින් මණ්ඩලය තෝරාපත් කර ගැනිම.

13. විශේෂ මහා සභා රැස්වීම :-

i. අත්‍යාවශ්‍ය සහ හදිසි කාර්යයන් සඳහා මහා සභා තීරණ ගැනිමට අවශ්‍ය වු විට දින 7කට කලින් දැනුම් දිමෙන් විශේෂ මහ සභාවක් කැඳවීමට හැකිය. එහෙත් එවැනි රැස්වීමකදී සාකච්ඡා කොට තීරණ ගත යුත්තේ එකී රැස්වීමකට හේතු වු කරුණ හෝ කාරණා පිළිබඳව පමණි.

ii. මහ සභාව ගත් තීරණය මත හෝ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් ලිඛිතව අත්සන් කොට, ඉදිරිපත් කරන ඉල්ලීමක් අනුව හෝ විශේෂ මහ සභා රැස්වීමක් ගරු ලේකම් මහතා විසින් කැඳවිය යුතුය.

14. යෝජනා :-

ආර්ය සමාජයට ඉදිරිපත් කරන යෝජනා ලිඛිතව අත්සන් කොට මහ සභා රැස්විමට දින 7කට කලින් ඉදිරිපත් කල යුතුය. එහෙත් හදිසි සහ අත්‍යාවශ්‍ය යෝජනා මහ සභා රැස්විමේදී ඉදිරිපත් කළ හැකිය.

## 5 වන කොටස

15. නිළධාරි මණ්ඩලයේ බලතල හා වගකීම් :-

i. ගරු සභාපති :-

සභා රැස්වීම් වල මුලසුනය ගෙන රැස්වීම් මෙහෙය වීම, යෝජනා ගෙන ඒම, අදහස් දැක්වීම, යෝජනා පිළිබද ඡන්දය විමසීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම.

ii. ගරු උප සභාපති :-

සභාපතිවරයාට ඔහුගේ කාර්යයන් ඉටුකිරීමට සහය දැක්වීම. ගරු සභාපතිවරයා නොමැති අවස්ථාවන්හි මුලාසනය දැරීම. රැස්වීම් මෙහෙයවීම වගකීම් දැරීම.

iii. උප සභාපතිවරු නොපැමිණි අවස්ථාවක තාවකාලික සභාපතිවරයෙක් තෝරාගෙන සභාව පැවැත්විය හැකිය.

iv. ගරු ලේකම් :-

සමිතියක හෝ සංගමයක මෙන් නොව ''ආර්ය සමාජයක'' වගකීම් සම්බන්ධයෙන් විශේෂ වගකීමක් ලේකම්වරයාට පැවරෙනු ඇත.

i. මහා සභා රැස්වීම්, විශේෂ මහ සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් කැඳවීම්, එවැනි රැස්වීම් සම්බන්ධව වාර්තා තැබීම්, ප්‍රකාශන නිකුත් කිරීම. වාර්ථා ඉදිරිපත් කිරීම, යෝජනා අදහස් ඉදිරිපත් කිරීම, ගරු සභාපතිවරුන්ගේ ගරු භාණ්ඩාගාරික හා කාරක සභිකවරුන්ගේ කාර්යයන් සම්බන්ධයෙන් උපදේශක සාකච්ඡා කිරීම. සහය දැක්වීම වගකීමෙන් කටයුතු කිරීම. ආර්ය සමාජයට වගකීම යන කරුණු දැරීම. නිරන්තරව නිලමඩුල්ල හා සාමාජිකත්වය සමඟ සුහද සම්බන්ධිකරණය ''හෙළදිව ධම්ම ගවෙසි සදහම් ආර්ය සමාජය'' නම හා ලිපිනය සහිතව ''ගරු ලේකම්'' නිල මුද්‍රාව දැරීම.

ii. පහත සඳහන් පොත්පත් හා ලිපිගොනු විධිමත්ව පවත්වාගෙන යාම සහ ඒවා සුරක්ෂිතව තබා ගැනීම.

(අ) මහ සභා සහ කාරක සභා වාර්තා පොත්.
(ආ) සාමාජික ලේඛනය.
(ඇ) ආර්ය සමාජය විසින් යවන සහ ලැබෙන ලිපි සම්බන්ධව ලිපිගොනු.
(ඉ) සාමාජික ඉල්ලුම්පත්
(ඊ) අවශ්‍යතාවය අනුව, වෙනත් පොත්පත් ලේඛන.
(උ) ආර්ය සමාජය සතු උපකරණ හා භාණ්ඩ.
(ඌ) ''හෙළදිව ධම්ම ගවෙසි සදහම් ආර්ය සමාජය'' නම දැක්වෙන ගරු ලේකම් නිල මුද්‍රාව.

v. ගරු උප ලේකම් :-

ලේකම් වරයාට සහය වීම හා ගරු ලේකම්වරයා නොමැති අවස්ථාවන්හි එම තනතුරේ කටයුතු වගකීමෙන් ඉටු කිරීම.

vi. ගරු භාණ්ඩාගාරික :-

සමිතියට ලැබුනු සියළු මුදල් භාරගෙන විධිමත් කුවිතාන්සි නිකුත් කිරීම, ආර්ය සමාජය අනුමත කරන සේවා සහ භාණ්ඩ වෙනුවෙන් වව්චර් ලබාගෙන මුදල් ගෙවීම. මුදල් ගනුදෙනු පිළිබඳව නිවැරදි වාර්තා පොත්පත් ක්‍රමවත්ව තැබීම හා ඒවා පවත්වාගෙන යාම. මහ සභා රැස්වීමේදී මුදල් ගනුදෙනු පිළිබඳව සංෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කිරීම. පහත සඳහන් පොත්පත් හා ලිපි ලේඛන පවත්වාගෙන යෑම සහ ඒවා සුරක්ෂිතව තබා ගැනීම.

(අ) මුදල් පොත (ආ) බැංකු පාස්පොත (ඇ) සුළු මුදල් පොත
(ඈ) ස්තිර තැන්පත් සහතික පත්
(ඉ) ජංගම තැන්පත් සම්බන්ධ චෙක් පොත් සහ මාසික වාර්තා
(ඊ) ඉන්වෙන්ට්‍රි (උ) බිල් පොත් හා කවුන්ටෆයිල්

16. මුදල් කටයුතු :-

හෙළදිව ධම්ම ගවෙසි සදහම් ආර්ය සමාජයට ලැබෙන මුදල් මහජන බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හෝ ඒ දෙකෙම හෝ තැන්පත් කළ යුතුය. අවශ්‍යතාවය අනුව අනුමත බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යා හැකිය.

i. සියළුම මුදල් ගනුදෙණු සම්බන්ධයෙන් භාණ්ඩාගාරික මහතා විසින් කුවිතාන්සියක් නිකුත්කල යුතුය.

ii. බැංකු ගිණුම් වලින් මුදල් ආපසු ලබා ගැනීම භාණ්ඩාගාරික ඇතුළුව සභාපති හෝ ලේකම් යන දෙදෙනෙකු අත්සන් කළ යුතුය.

# 6 වන කොටස

17. ව්‍යවස්ථාව සංශෝධනය :-
(ව්‍යවස්ථාව සංශෝධනය සඳහා ඝන පූර්ණය)

i. ව්‍යවස්ථා සංශෝධනය :-

ව්‍යවස්ථාව සංශෝධනය යනුවෙනි අදහස් කරන්නේ මෙම පිළිගත් ව්‍යවස්ථා මාලාවේ වචනයක් හෝ වගන්තියක් ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට හෝ එකතු කිරීම යන්නයි.

කාලීන අවශ්‍යතාව අනුව සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන ව්‍යවස්ථාව පිළිබඳ පූර්ණ විස්තරයක් සෑම සාමාජිකයෙකු වෙතම සැපයිම යුතුය. ඒ සඳහා පැවැත්වීමට බලාපොරොත්තු වන මහ සභා රැස්වීමට සතියකට ප්‍රථම ලිඛිතව දැන්විය යුතුය.

18. ඝන පූර්ණය :-

ව්‍යවස්ථා සංශෝධනය මුළු සාමාජික සංඛ්‍යාවෙන් පහෙන් දෙකකට (2/5) නොඅඩු සංඛ්‍යාවක් පැමිණි මහ සභා රැස්වීමකදී තුනෙන් දෙකකට (2/3) වැඩි ඡන්දයෙන් ව්‍යවස්ථා සංශෝධනය කිරීම හෝ අළුත් ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම කළ හැකිය.

.........................
ගරු සභාපති

.........................
ගරු ලේකම්